මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PE/2024/22 **2024.10.15**

# පාර්ලිමේන්තු මැතිවරණය - 2024

## තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම සහ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම

2024 පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද නිකුත් කිරීම, සලකුණු කිරීම හා නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම සම්බන්ධව අදාළ කටයුතු මේ වන විට සංවිධානය කර ඇත.

තැපැල් ඡන්ද නාමලේඛන සහතික කිරීම 2024. 10.16 වන දින සිදු කරන අතර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා තැපෑලට භාරදීම 2024.10.23 වන දින සිදු කරනු ලබයි.

ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ සියලුම කාර්යාල, මැතිවරණ කාර්යාල හා පොලිසිය යන ආයතනවල තැපැල් ඡන්ද හිමියන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම **2024.10.30** හා **2024.11.04** වන දිනයන්හි සිදු කිරීමට නියමිත අතර, අනෙකුත් රාජ්‍ය ආයතනවල හා හමුදා කඳවුරුවල තැපැල් ඡන්ද හිමියන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම **2024.11.01** හා **04** වන දිනයන්හි දී සිදු කෙරේ. මෙම දිනවල තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වන තැපැල් ඡන්ද හිමියන්ට **2024.11.07** සහ **08** වන දිනයන්හි දී තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට අවස්ථාව සලසා ඇත.

2024 පාර්ලිමේන්තු මැතිවරණයේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තැපෑලට භාරදීම **2024.10.26** වන දින සිදු කිරීමට කටයුතු යොදා ඇත.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාදීමේ විශේෂ දින ලෙස **2024.10.27, 31** හා **2024.11.03** යන දිනයන්හි දී කටයුතු සිදු කරන අතර, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අවසන් බෙදීම **2024.11.07** දින සිදු කෙරේ. 2024.11.07 දිනෙන් පසුව නිල ඡන්ද දැන්වීම් පත් නොලැබූ ඡන්ද හිමියන්ට 2024 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයට අදාළ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව නිල ඡන්ද දැන්වීම්පත ලබා ගත හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්